# වෙළෙඳ සංස්කෘතිය හා අධ්‍යාපනය

ආර්යයන් දඹදිවට පැමිණීමෙන් පසුව සංස්කෘතියෙහි සිදු වූ වෙනස්කම් ගැන කතාකිරීමට පෙර සාධාරණ වශයෙන් (in general) සංස්කෘතියක් තවත් සංස්කෘතියක් සමග ගැටීමෙන් පසු, එනම් තවත් සංස්කෘතියක් මුණගැසීමෙන් පසු වෙනස්වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව සුළු වශයෙන් වුව ද සාකච්ඡා කළ යුතු වෙයි. සංස්කෘතියකට තවත් සංස්කෘතියක් මුණගැසීම ක්‍රම කිහිපයකට සිදුවිය හැකි ය. ඒ සමානත්වතාවෙන් සිදුවන මුණගැසීමක් විය හැකි ය. එසේත් නැතහොත් ආක්‍රමණශීලී යටත්විජිතවාදී සංස්කෘතියක මුණගැසීම විය හැකි ය. එසේත් නැතහොත් තමන් ආක්‍රමණශීලීව වෙනත් සංස්කෘතියක් මුණගැසෙනු විය හැකි ය. සංස්කෘතියක් හඳුන්වාදීමේ අභිප්‍රායෙන් කෙරෙන මුණගැසීම් ද වෙයි.

යටත්විජිතවාදී අපේක්ෂා නැතිවිට වෙළෙන්දෝ, උගත්තු ආදීහු ඇතැම්විට තමන් නොදැනුවත් ව සංස්කෘතියක වාහක වෙති. රටකින් රටකට යන වෙළෙන්දෝ ඒ රටෙන් මේ රටටත් මේ රටෙන් ඒ රටටත් සංස්කෘතීන් හඳුන්වාදෙති. එක් රටක නිෂ්පාදනය කෙරුණු භාණ්ඩයක් වෙනත් රටකට හඳුන්වාදීම ම සංස්කෘතික වෙනසක් හඳුන්වාදීමක් විය හැකි ය. ඇතැම් විට ඒ භාණ්ඩය දෙවැනි රටෙහි කිසි දිනෙක යොදා නොගැණුනු භාණ්ඩයක් විය හැකි ය. එසේත් නැතහොත් එවකටත් යොදා ගැණෙන භාන්ඩයක නව මාදිලියක් විය හැකි ය. ඒ කුමක් වුවත් එසේ හඳුන්වාදෙනු ලැබූ භාණ්ඩය දෙවැනි රට විසින් පිළිගනු ලැබුවහොත් එහි යම් සංස්කෘතික වෙනස්වීමක් සිදුවනු ඇත.

උගතුන් ද එලෙස සංස්කෘතික වෙනස්වීම් හඳුන්වා දෙන බව පැහැදිලි ය. තමන් විදේශයක දී ඉගෙන ගත් දෙයක් තම රටට හඳුන්වාදීමට බොහෝ උගත්තු කැමති වෙති. අද මේ ප්‍රකාශය තරමක් සංශෝධනය කිරීමට සිදු වී ඇත. එයට හේතුව අද දිවයිනෙන් බැහැර නොගොස් ම අන්තර්ජාලය හා වෙනත් ක්‍රම ඔස්සේ අළුත් අළුත් දෑ හඳුන්වා දිය හැකි බැවිනි. අන්තර්ජාල හා වෙනත් පහසුකම් ඇති රටවල දී උගතුන්ට අන්තර්ජාලයට හා වෙනත් එවැනි මාධ්‍යවලට අවශ්‍ය ආකාරයට සංස්කෘතිය ඉතා සුළුවෙන් හෝ වෙනස්කිරීමට හැකිවෙයි.

වෙනත් බොහෝ අයට වඩා කලාකරුවනට හා ජනමාධ්‍යකරුවනට මේ වරම හිමිවෙයි. එයට හේතුව වන්නේ ජනතාව වෙනත් කෘතීන්වලට වඩා කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරු කරන බැවිනි. අද මේ ක්ෂේත්‍ර දෙක ඔස්සේ මෙරට සංස්කෘතියෙහි කෙතරම් වෙනසක් කෙරෙන්නේ ද යන්න සිතා බැලිය යුතු ය. කලාකරුවෝ ද ජනමාධ්‍යවේදීහු ද පිටරට ඇති දේ අපට හඳුන්වා දෙති. සංගීතයෙහි වේවා චිත්‍රපටියෙහි වේවා නවකතාවෙහි වේවා පිටරට පැතිර යන නවතම විලාසිතා මෙරට පැතිරවීම බොහෝ කලාකරුවන්ගේ කාර්යභාරය බවට පත් වී ඇත. ඒ සඳහා ඔවුන්ට යම් ගෙවීමක් විවිධ ආකාරයෙන් කෙරෙන බවට සැකයක් තිබිය හැකි නො වේ. ඒ ගෙවීම් ත්‍යාග, සම්මාන ආදී වශයෙන් ද ලැබෙයි. එලෙස ගෙවීම් කෙරෙන්නේ විශේෂයෙන් ම බටහිර සංස්කෘතිකාංග පැතිරවීම සඳහා ය.

උගතුන්ට ද බටහිර දැනුම ප්‍රචලිත කිරීම සඳහා ගෙවීම් කෙරෙයි. ශිෂ්‍යත්ව අධි ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම් ආදී වශයෙන් මෙරට හා පිටරට ඒ ගෙවීම් කරනු ලැබෙයි. අද බොහෝ සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය මෙරට හෝටල් නමින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන පෙළේ ආපන ශාලාවල හා නවාතැන් පොළවල පැවැත්වෙයි. ඒ සඳහා මුදල් මෙන් ම සහභාගිවන උගතුන්ගේ දිනපතා ගාස්තු ද විවිධ ආයතනවලින් ගෙවනු ලැබෙයි. සම්මන්ත්‍රණ ඔස්සේ ද අවසාන වශයෙන් සිදුවන්නේ බටහිර දැනුම් සංස්කෘතිය මෙරට පතුරවන උගතුන්ට ගෙවීමකි. එහෙත් ඒ එවැනි ගෙවීමක් බව උගතුන්ට නොතේරෙන ආකාරයට කටයුතු සිදුවෙයි.

බටහිර විශ්වවිද්‍යාලයක ඉගෙනීමට යන උගතකු එරට පර්යේෂණ විධි ක්‍රමයක පුහුණුව ලැබී යැයි සිතමු. එවිට ඔහු මෙරටට පැමිණි පසු කරන්නේ අර පිටරට තිබෙන උපකරණ මිල දී ගැනීමට කටයුතු කිරීම ය. ඒ පොතපත මිල දී ගැනීමට තම ආයතනයට උපදෙස් දීම ය. ඒ පොතපත නොකියවිය යුතු යැයි මෙයින් අදහස් නො කෙරෙයි. එහෙත් සිදුවන්නේ එකම අච්චුවේ අධ්‍යාපනයක් ඒ ඒ රටවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබාදීම ය. ලෝකයේ විවිධත්වයක් ගැන කුමක් කතා කළ ද අවසානයේ දී සිදුවන්නේ මුළු ලෝකය ම එකම අච්චුවකට දැමීමට උත්සාහ කිරීම ය. ඒ උත්සාහය සාර්ථක වේ ද යන්න අනාගතයේ දී තීරණය වනු ඇත.

© Prof. Nalin De Silva

එහෙත් පෙර කල එවැනි ගෙවීම් නො සිදුවිණි. පැරණි උගතුන් විදේශවලට ගියේ බොහෝ විට ඉගෙනීමට ය. ඔවුන්ගේ ගමන් දේශ ගවේෂණ ආකාරයෙන් සිදුවිණි. ලංකාවට ද ඈත අතීතයේ විවිධ රටවලින් හා ප්‍රදේශවලින් දේශ ගවේෂක උගතුන් පැමිණ ඇත. එහෙත් ඔවුන් නිසා සිදු වී ඇති සංස්කෘතිකාංග වෙනස නො ගිණිය හැකි ප්‍රමාණයේ බව අමතක නොකළ යුතු ය. අද ඉගෙනගැනීම ද සංස්කෘතික අධිපතිවාදී ආකාරයකින් සිදු කෙරෙයි. එහෙත් අවාසනාවකට බොහෝ උගතුන්ට අද තමන් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ ව අවබෝධයක් නැත. එදා උගත්තු නොදැනුවත්ව ඇතැම් විට සංස්කෘතිකාංග රටකින් රටකට හඳුන්වා දුන්හ. ඒ ක්‍රියාවලිය දෙපැත්තට ම සිදුවිය. එහෙත් අද එසේ නො වේ. අද උගත්තු ඇතැම්විට නොදැනුවත් ව බටහිරින් සංස්කෘතිකාංග ආනයනය කර බෙදාහරිති. එහෙත් ඒ එක් පැත්තකට පමණක් සිදුකෙරෙන ව්‍යාප්තියකි. වෙනත් වචන වලින් කියන්නේ නම් බටහිරින් වෙනත් රටවලට දැනුම ලබාදීමකි. අනෙක් පැත්තට, එනම් අනෙක් රටවල සිට බටහිර රටවලට එසේ ව්‍යාප්ති ගලා යන බවක් නො පෙනෙයි.

උගතුන් වෙළෙන්දන් ආදීන්ගෙන් අද මෙන් නොව එදා සිදුවූයේ පෞද්ගලික මට්ටමින් කෙරුණු සංස්කෘතිකාංග පැතිරවීමකි. එහෙත් අද ඒ එසේ නො වේ. බටහිර සිට අනෙක් රටවලට වෙළෙඳාම හා අධ්‍යාපනය ඔස්සේ අද සංස්කෘතිකාංග ගලා යන්නේ, නිවැරදිව කියන්නේ නම් ගලා යවන්නේ, සංවිධානාත්මක ව ය. මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. පාසල්,  විශ්වවිද්‍යාල ආදිය අද ලෝකයේ ම පවත්වාගෙන යන්නේ අඩු වැඩි වශයෙන් ගතහොත් එකම ආකාරයකිනි. එමෙන් ම වෙළෙඳාම ද එකම ආකාරයකින් එකම වර්ගයේ වෙළෙඳසල්හි පවත්වාගෙන යෑමට දරණ උත්සාගය ද කැපී පෙනෙයි. අද ලංකාවේ කුඩා නගරවල ද බිහිවෙමින් පවතින සුපර්මාකට් නමින් හැඳින්වෙන වෙළෙඳසල් ජාල ඒ සඳහා එක් උදාහරණයක් පමණකි.

ඒ අතර වෙළෙඳාම අධ්‍යාපනයක් බවට ද, අධ්‍යාපනය වෙළෙඳාමක් බවට ද පත් වී ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් විවිධ විෂය හා ක්ෂෙත්‍ර වෙන්කිරීමට උත්සාහ දැරුණ ද, ඒ සියල්ල පදනම් වන්නේ කරුණු කිහිපයක් මත ය. මේ කරුණු කිහිපය ද එකිනෙකින් ස්වායත්ත නො වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇති ප්‍රධාන පරස්පරය එය වෙයි. අධ්‍යාපනය හා වෙළෙඳාම වෙන්කිරීමට තැත් කෙරුණ ද ඒ දෙක අද ක්‍රමයෙන් එකක් අනෙකෙහි කාර්යභාරය ද ඉටු කෙරෙනු දක්නට ඇත.

එදා දඹදිව සම්ප්‍රදායෙහි ඉගෙනගැනීමට අවශ්‍ය වුවෝ පරිබ්‍රාජිකයන්, ශ්‍රමණයන් ලෙස තැනින් තැන ගියහ. දඹදිව සමාජයෙහි ඉගෙනීම හා විමුක්තිය සොයා යෑම අතර සම්බන්ධකමක් තිබුණි. ඒ ශ්‍රමණ පරිබ්‍රාජිකයන්ට කිසිවකු කිසිම ගෙවීමක් කර නොමැත. ඔවුන් ජීවත්වූයේ අනෙක් අයගේ ආධාරයෙනි. එනම් අනෙක් අයගෙන් සිඟා කෑමෙනි. බුදුන්වහන්සේ හා භික්ෂූන්වහන්සේ ද පිඬුසිඟා වැඩි බව අමතක නොකළ යුතු ය. තමන් ඉගෙනගත් දේ අනෙක් අයට මුදලට විකිණීමට ඔවුන්ට අවශ්‍ය නො වී ය. ඔවුන් ජීවත්වූයේ ඉගෙනගැනීමට මිස ඉගෙනගත්තේ ජීවත්වීමට නො වෙයි. ඉගෙනගැනීමේ එකම ඵලය ජීවත්වීමේ ක්‍රමයක් තනාගැනීම නො වී ය.

එහෙත් මෙයින් කියැවෙන්නේ පරිබ්‍රාජිකයන් නොවන වෙනත් ඉගෙනගත්තවුන් නොසිටි බව නො වෙයි. දඹදිව මෙන් ම ලංකාවේ ද ශිෂ්‍යයෝ විවිධ දෑ ගුරුවරුන්ගෙන් ඉගෙනගත්හ. එකල දිසාපාමොක් ඇදුරෝ දඹදිව සිටියහ. ගුත්තිල ඇදුරුතුමන්ගෙන් ශිල්ප හැදෑරීමට මුසිල ගියේ ය. එහෙත් ඒ ගුරුකම කිසිදා වෙළෙඳාමක් නො වී ය. ගුරුවරුන්ට එදා තුටු පඬුරු පිදෙන්නට ඇත. එහෙත් ඒ සතුටු සිතින් පිරිනැමුණු දෙයක් විය.

අද අධ්‍යාපනය මුළුමනින් ම මෙන් වෙළෙඳාමක් බවට පත් වී ඇත. ඒ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි මිනිස් සම්බන්ධකම් දකින්නේ ගනුදෙනුවක් ලෙස ය. ගුරුවරයාට අද ශිෂ්‍යයකුට යමක් ඉගැන්වීමට සිදු වී ඇත්තේ ඒ සඳහා ශිෂ්‍යාගෙන් හෝ වෙනත් අයකුගෙන් හෝ රජයෙන් හෝ යමක් බලාපොරොත්තුවෙනි. ඒ ගුරුවරයාගේ වරදක් නො වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් ගුරුවරයා එවැනි තත්වයකට පත්කරනු ලැබ ඇත. පෞද්ගලික උපකාරක පංති යනු ගුරුවරයා හා ශිෂ්‍යයා අතර ගනුදෙනුව ඉතාමත් නග්න ආකාරයෙන් පවත්වාගෙන යන ආයතන වෙයි.

© Prof. Nalin De Silva

අධ්‍යාපනය වෙළෙඳාමක් බවට පත්වන්නේ වෙළෙඳාම අධ්‍යාපනයක් බවට පත්කරමිනි. එක් පැත්තකින් අද වෙළෙඳාම ද ඉගැන්වෙන ආයතන වෙයි. වාණිජ්‍යය හා ව්‍යාපාර පරිපාලනය උගන්වන ආයතන හා විශ්වවිද්‍යාලයීය පීඨ තැනින් තැන ඇතිවෙයි. මේ පීඨ අද විශ්වවිද්‍යාලවල ප්‍රධාන පීඨ බවට පත්වෙමින් ඇත. ඇමරිකන් එක්සත් ජනපදයේ දැනටමත් ඒ තත්වය උදා වී ඇත. ඈත අතීතයේ බටහිර විශ්වවිද්‍යාලවල ප්‍රධාන පීඨ වූයේ මානව ශාස්ත්‍ර හා නීති පීඨ ය. පසුව ඒ තත්වය විද්‍යා පීඨවලටත් ඉන්පසුව කාර්මික හා වෛද්‍ය ආයතන ඔස්සේ ඇතැම් විශ්වවිද්‍යාලවල ව්‍යවහාරික විද්‍යා (ඉංජිනේරු) හා වෛද්‍ය පීඨවලටත් හිමිවිය. එහෙත් අද ඒ තත්වය ක්‍රමයෙන් වාණිජ්‍ය හා ව්‍යාපාර පරිපාලන පීඨවලට හිමිවෙමින් පවතියි.

ඒ වෙළෙඳාම අධ්‍යාපනය බවට පත්වන විශේෂිත අවස්ථාවකි. අද වෙළෙඳාම එසේ විශේෂිත අවස්ථාවක පමණක් නොව සාමාන්‍ය ජීවිතයේ ද අධ්‍යාපනයක් බවට පත් වී ඇත. අද ජනමාධ්‍යයෙහි වෙළෙඳ දැන්වීම් ඔස්සේ ද ලබාදෙන්නේ අධ්‍යාපනයකි. අසවල් භාණ්ඩය අසවල් කරුණ සඳහා වැදගත් යැයි නළු නිළියෝ හා වෙනත් අය අපට කියා දෙති. බොහෝවිට අපේ අවශ්‍යතා කවරේදැයි අපට කියා දෙන්නේ ද මේ වෙළෙඳ දැන්වීම් ඔස්සේ ය. ඇතැම්විට අපට කිසිසේත් ම අනවශ්‍ය දේ ද අපේ අවශ්‍යතා බව අපට ඉගැන්වෙයි. ප්‍රසිද්ධ කියමනකට අනුව ඇස්කිමෝවරයකුට ශීතකරණයක් අවශ්‍ය මන්ද යන්න ද වෙළෙඳ දැන්වීම් ඔස්සේ ඉගැන්විය හැකි ය. දැන් කෙසේ වුව ද ටික කලකට පෙර අපට සාමය අවශ්‍ය මන්දැයි සාම වෙළෙන්දෝ කියා දුන්හ. මේ වෙළෙඳ දැන්වීම් නිර්මාණය කරන්නන්ට ද ගෙවීම් කෙරෙන බව අමුතුවෙන් කිවයුතු නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva